සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

## 6 - ශ්‍රේණිය

## නර්තනය (දේශීය)

නම/විභාග අංකය :- ........................................................................ කාලය: පැය 02යි.

### I කොටස

- මෙම ප්‍රශ්න පත්‍රයේ ම පිළිතුරු සපයන්න.
- සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

(01) පා සරඹ / මණ්ඩිපද කටා අවසන් කරනුයේ.......,

(1) ඉරට්ටියෙනි. (2) තත්තිරමෙනි. (3) තලාසමෙනි. (4) හවාර පදයෙනි.

(02) 'ඉරට ඔබිය ඉර මුඳුනේ සිටියා
සඳට ඔබිය සඳ මුඳුනේ සිටියා.......' යන කවිය

(1) ලී කෙළි කවියකි. (2) නැළවිලි කවියකි. (3) කළගෙඩි කවියකි. (4) ගොයම් කවියකි.

(03) හනුමා වන්නම, හනුමන්තා තාලය පින්දු වන්නම හෝ අනිලා වන්නම ගායන කරනු ලබන්නේ.....

(1) මාත්‍රා 4 තනිතිතට ය. (2) මාත්‍රා 2 තනිතිතට ය.
(3) මාත්‍රා 3 + 4 දෙතිතට ය. (4) මාත්‍රා 2 + 3 දෙතිතට ය.

(04) ගැමි නැටුම්වල ලක්ෂණයක් නොවන්නේ,

(1) උපකරණ භාවිතය (2) ගායනය භාවිතය (3) තනිව නැටීම (4) සරල බව

(05) මින් සතුට නැමැති භාවය ප්‍රකාශ නොවන්නේ,

(1) කුරුල්ලන්ගේ පියඹා යෑම (2) මඳ පුළඟක් හැමීම
(3) ළමුන් සෙල්ලම් කිරීම (4) අහසේ ගිගුරුම් හඬ ඇසීම

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා හරිනම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

(06) සමූහ වාදන නිර්මාණයේ දී විකල්ප වාද්‍ය උපකරණ භාවිත නොකරයි. ( )

(07) "මීවාද සිප්ප දාමෙන්න....." ගුරුවන්දනා ගාථාවකි. ( )

(08) "තෛපොංගල් උත්සවය" පවත්වනු ලබන්නේ දෙසැම්බර් මාසයේ ය. ( )

(09) "වඩිගපටුන" පහතරට නර්තන සම්ප්‍රදායට අයත් නර්තනාංගයකි. ( )

(10) "පාන්දරින් ස්කෝලට" යන ගීතය නර්තන නිර්මාණයට සුදුසු ගීතයක් නොවේ. ( )

- ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්න සඳහා සුදුසු පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(11) සැරසිලි නිර්මාණය කර ගැනීම සඳහා ................................. ස්වභාවික අමුද්‍රව්‍යයක් ලෙස යොදා ගනියි. (පොල්කොළ / ගොප්කොළ)

(12) ගැමි ජනජීවිතය හා බැඳි ගායන ................................. ගායන ලෙසින් හැඳින්වේ. (ගැමි / වන්නම්)

(13) නත්තල් උත්සවයේ දී ................................. ගීත ගායනා කරනු ලැබේ. (කැරොල් / භක්ති)

(14) නිත්තවෙල ගුණයා මහතා ................................. නර්තන ශිල්පියෙකි. (උඩරට / පහතරට)

(15) "උඩපල ගත්තත් වට්ටක්කා" යන රබන් පදය වාදනය සඳහා ................................. යොදා ගනියි. (අත් රබාන / බංකු රබාන)

- 16 සිට 20 දක්වා ප්‍රශ්න සඳහා ගැලපෙන පද යා කරන්න.

| | | |
|---|---|---|
| (16) | පා සරඹ | කළගෙඩි |
| (17) | ඊං බෙරය | භාව ප්‍රකාශන |
| (18) | සත්ව චරිත | විකල්ප වාද්‍ය උපකරණයකි. |
| (19) | අංග, ප්‍රත්‍යාංග, උපාංග | නාම්‍යතා අභ්‍යාස |
| (20) | ගැමි නැටුම් | මණ්ඩි පද |

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න දෙකක් ඇතුළුව ප්‍රශ්න තුනකට පිළිතුරු සපයන්න.

(01) (1) නර්තනයේ මූලික ඉරියව්ව ................................. නමින් හඳුන්වයි.

(2) නර්තනය සඳහා අවශ්‍ය හැඩතල සකස් කරගනු ලබන්නේ ................................. අභ්‍යාස මඟිනි.

(3) වඳුරකුගේ හැසිරීම පිළිබඳ කියවෙන්නේ ................................. වන්නමෙනි.

(4) වෙසක් උත්සවය සමරනු ලබන්නේ බුදුරජාණන් වහන්සේගේ ................................. සිහිකිරීම සඳහා ය.

(5) සබරගමු පළාතේ පවත්වනු ලබන ප්‍රධානතම පෙරහැර මංගල්‍යය ................................. පෙරහැරයි.

(6) ඇම්බැක්කේ දේවාලයේ ලී මාල්කයක කැටයම් කර ඇත්තේ ................................. නැටුමක අවස්ථාවකි.

(7) මාත්‍රා 2 + 2 තාල රූපය ................................. ලෙසින් හඳුන්වයි.

(8) 'සමනළ වන්නම' නිර්මාණය කරන ලද්දේ ................................. ගුරුතුමා ය.

(9) තාල තැබීම සඳහා ................................. ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ලෙසින් යොදා ගනියි.

(10) "මගෙ පොඩි යාළු" යන ගීතය රචනා කරන ලද්දේ ................................. මහතා විසිනි.

(ලකුණු 2 × 10 = 20)

(02)

| දේශීය නර්තන සම්ප්‍රදායන් | උඩරට නර්තන සම්ප්‍රදාය | පහතරට නර්තන සම්ප්‍රදාය | සබරගමු නර්තන සම්ප්‍රදාය |
|---|---|---|---|
| නර්තන සම්ප්‍රදායන් ප්‍රචලිත ප්‍රදේශ 02 | 1. ..................<br>.................. | 2. ..................<br>.................. | 3. ..................<br>.................. |
| නර්තන සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන ශාන්තිකර්මය | 4.<br>.................. | දෙවොල් මඩු ශාන්ති කර්මය | 5.<br>.................. |
| එක් එක් සම්ප්‍රදායන්ට අයත් ප්‍රධාන වාද්‍ය භාණ්ඩය | 6.<br>.................. | 7.<br>.................. | දවුල |
| රංග වස්ත්‍රාභරණ කට්ටලය | 8.<br>.................. | 9.<br>.................. | 10.<br>.................. |

(ලකුණු 20)

(03) (1) තනිතිතේ ප්‍රභේද නම් කරන්න. (ලකුණු 04)

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(2) මාත්‍රා දෙකට අයත් රබන් පදයක් ලියන්න. (ලකුණු 08)

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(3) මාත්‍රා දෙකට අයත් බෙර පදයක් ප්‍රස්ථාර ගත කරන්න. (ලකුණු 08)

(04) (1) ද්‍රවිඩ සංස්කෘතිය හා බැඳුණු ගැමි නැටුම් 02ක් ලියා දක්වන්න. (ලකුණු 04)

..........................................................................................................................................

..........................................................................................................................................

(2) ඔබ ප්‍රදේශයේ පෙරහැරක දක්නට වූ ගැමි නැටුම් 04ක් නම් කරන්න. (ලකුණු 08)

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

..........................................................................................................................................

(3) ඔබ කැමැති ගැමි නැටුමකට අදාල කවියක් ලියන්න. (ලකුණු 08)

(05) මෙම මාතෘකා අතුරින් තෝරා ගත් මාතෘකා දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

(1) විකල්ප වාද්‍ය උපකරණ (2) මණ්ඩිය (3) සරඹ අභ්‍යාස (4) එජ්. එච්. සච්රිජ් පිල්වා මහතා

(ලකුණු 10 x 2 = 20)